

# සංක්‍රමණික ශාකවලින් හරිත රන් සුරැකුම


## ගරු. මහින්ද විජේසේකර මැතිතුමා

වන සම්පත් හා පරිසර අමාත්‍ය



LIBRARY
Ministry of Environment &
Natural Resources.


1999 ඔක්තෝම්බර් මස 15 වන දින ජාතික විද්‍යා පදනම් ශ්‍රවණාගාරයේදී පවත්වන ලද ආගන්තුක / ආක්‍රමණකාරී සත්ත්ව හා ශාක විශේෂ පිළිබඳ ජාතික වැඩමුළුවේදී, පාර්ලිමේන්තු මන්ත්‍රී, වනසම්පත් සහ පරිසර අමාත්‍ය ගරු. මහින්ද විජේසේකර මැතිතුමා විසින් පවත්වන ලද දේශණය ඇසුරින් සැකසිනි.

ජෛව විවිධත්වය, ආගන්තුක හා ආක්‍රමණකාරී විශේෂ යන වචන දේශපාලඥයකු වශයෙන් මට නුහුරු වුවත්, එම වචන වල අර්ථ හා සංකල්ප වල ප්‍රායෝගික ලක්ෂණ මට හෝ අනෙක් ශ්‍රී ලාංකිකයන්ට හෝ අළුත් දෙයක් නම් නොවේ. ඒ මන්ද යත් අප බොහෝ දෙනෙකු ශාක, සත්තව හා ක්ෂුද්‍ර ජීවීන් හා පරිසරය පිළිබඳවත්, ඒවා මගින් ඇතිකරන හිතකර සහ අහිතකර බලපෑම් පිළිබඳවත්, අවබෝධයකින් ජීවත්වන බැවිනි.

"ආක්‍රමණය" යන වචනය ශ්‍රී ලංකාවට අලුත් දෙයක් නොවේ. අපගේ ඉතිහාසය ආරම්භයේ සිටම විශේෂයෙන්ම 15 වන ශතවර්ෂයේ සිටම මානව ආක්‍රමණයන් සිදුවී තිබේ. මෙම ආක්‍රමණයන්ගේ බලපෑම ජෛව විවිධත්වයට පමණක් නොව, සංස්කෘතික, චර්යාත්මක මෙන්ම සාමාජික වශයෙන්ද වෙනස්කම් ඇති කිරීමට හේතු වී ඇත. ශ්‍රී ලංකාවේ කඳුකරයේ වූ ඉතා අලංකාර වනගහනය වෙනුවට තේ වතු බිහිවීම මෙම බලපෑම්වල පැහැදිලි ප්‍රතිඵලයක් දෙස දැක්විය හැකිය.

හරිත රන් (Green Gold) නමින් හැඳින්වෙන ජෛව විවිධත්වයට විවිධ තර්ජන එල්ලවීමේ ප්‍රවණතාවයක් සංවර්ධනය වෙමින් පවතින රටවල් තුළ දක්නට ලැබේ. ආගන්තුක විශේෂ විසින් සිදුකරන ජෛවී ආක්‍රමණ මේ අතුරින් ප්‍රධාන තැනක් ගන්නා බව විද්‍යාඥයින් ගේ මතයයි.

ආගන්තුක විශේෂ මගින්, දේශීය (Native) ජෛව විවිධත්වයට සිදුවන ජෛව ආක්‍රමණය මේ අතුරින් ප්‍රධාන තැනක් ගනී. ස්වාභාවික, අර්ධ ස්වාභාවික පරිසර පද්ධති හෝ වාසස්ථාන ආක්‍රමණය කරන, ආගන්තුක සත්ව හා ශාක විශේෂ ආක්‍රමණකාරී විශේෂ යනුවෙන් හඳුන්වයි. ඒවා මගින් විවිධ වෙනස්කම් ඇතිකරන නිසා දේශීය ජෛව විවිධත්වයට තර්ජන එල්ල වී තිබේ. එම ආක්‍රමණකාරී විශේෂ නිසා සිදුවන පරිසර හානිය ඉතාම බරපතලය. බොහෝ අවස්ථාවලදී ආපසු යථා තත්ත්වයට පත් කළ නොහැකිය. එමගින් සිදුවන වාසස්ථාන විනාශ වීමේ හානියට වඩා ජීවී විශේෂවලට සහ පරිසර පද්ධතිවලට ගෝලීය වශයෙන් සිදුවන බලපෑම් බරපතලය.

දැන් මගේ ප්‍රදේශයේ ඇති වැව් බොහොමයක් ජලජ තෘණ (Water Grass) වලින් වැසී ඇත.එම ජලජ තෘණ නිසා එම වැව් වල ජීවත්වන ජලජ ජීවීන්ට

එම වැව් මත යැපෙන ජීවී සන්තති වලට ඉතා අහිතකර බලපෑම් ඇති වී තිබේ. මේ හැරෙන්නට ශ්‍රී ලංකාවේ ආක්‍රමණකාරී ශාක වලට දෘෂ්‍ය නිදර්ශන රැසක් ඇත. මේ අතර ලංකාව පුරා ජලජ පරිසර වල දක්නට ලැබෙන සැල්වීනියා සහ ජපන් ජබර සහ විශේෂයෙන් උඩවලවේ ජාතික වනෝද්‍යානයේ ව්‍යාප්තව ඇති ගඳපාන (බාලොලියා), වල් ආතා සහ යෝධ නිදිකුම්බා හඳුන්වා දිය හැකිය.

සාගර, කඳු, ගංගා හා කාන්තාර වැනි ස්වාභාවික බාධක මගින් හුදකලාවී අවුරුදු මිලියන ගණනාවක් ගත වු පසු නව ජීවී විශේෂයක් ඇතිවනු ඇත.නමුත් ගත වු වසර 100 ක පමණ කාලය තුළ මිනිසුන්ගේ බලපෑම හේතුකොට ගෙන මෙම ස්වාභාවික බාධකවල බලපෑම නැති වී ගොස් ඇත. ගමනාගමනය හා වෙළදාම වැනි ක්‍රියාකාරකම් වලදීද, ආගන්තුක ජීවී විශේෂ, දැනුවත්ව හෝ හිතාමතාම පරිසරයට හඳුන්වාදීම නිසාද, අවුරුදු මිලියන ගණනාවක් හුදකලාවී තිබු ජීවී විශේෂ ඉතා සුළු කාලයකින් නිරාවරණය වේ. මේ නිසා සංවර්ධිත රටවල් වලට මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල් වලද ඇති වී ඇති ප්‍රශ්න සුළු පටු නොවේ. ආක්‍රමණකාරී, ආගන්තුක විශේෂවල තර්ජනය සාගර දූපත්වලට විශේෂයෙන්ම බලපා ඇති අතර එම බලපෑම් නිසා දූපත්වල විසු සිය දහස් ගණනක් ජීවීන් සදහටම තුරන් වී (Extinct) ගොස් ඇත. මේ නිසා සාගර දූපතක් වන අප රට පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර, ඒ සඳහා අවශ්‍ය පියවර ඉතා ඉක්මණින් ගන්නා ලෙස මෙහි පැමිණ සිටින විද්‍යාඥයන්ගෙන් මම ඉල්ලා සිටිමි.

ආර්ථික වශයෙන් මෙන්ම පාරිසරික වශයෙන්ද මෙම ජෛව ආක්‍රමණයන් නිසා සිදුවන හානිය අතිවිශාලය. ආක්‍රමණකාරී සත්ව හා ශාක විශේෂ, සියළුම වර්ගීකරණ බාණ්ඩවලට අයත් වන අතර ඔවුන් ලොව ඇති සියළුම පරිසර පද්ධති ආක්‍රමණය කර එම පරිසරයේ ජීවත්වන දේශීය ජීවීන්ට හානි පමුණුවයි.

ආක්‍රමණකාරී විශේෂ නිසා දේශීය ජීවීන්ට හා පරිසර පද්ධතිවලට සිදුවන පාරිසරික හානිය නැවත යථා තත්ත්වයට පත්කල නොහැකිය. එමෙන්ම එම ජීවීන් නිසා සිදුවන ආර්ථික හානිය වසරකට ඩොලර් බිලියන ගණනක් වේ. වල් පැළෑටි නිසා භෝග අස්වැන්න අඩුවන බැවින් ඒවායේ මිල ඉහළයයි. ජලජ ආක්‍රමණකාරී පැළෑටි නිසා කරදිය මිරිදිය ජලාශ පද්ධති බිඳ වැටේ. මේ නිසා එම ජලාශ මත යැපෙන ධීවරයන් සහ අනෙකුත් පුද්ගලයන්ගේ ආදායම් මාර්ග අඩුවේ.

ඉහත උදාහරණවලින්, ආක්‍රමණකාරී විශේෂ නිසා සිදුවන පරිසර හානියෙන් දුප්පත් ජනතාවගේ ආදායම තවදුරටත් අඩුවන බව පැහැදිලි වේ. දුප්පත්කම තුරන් කිරීමට ආක්‍රමණකාරී විශේෂ මර්ධන කිරීමත් වැදගත් බව පෙනේ. මෙය විද්‍යාඥයන් වශයෙන් ඔබ සැමගේ අවධානය යොමු විය යුතු කරුණකි. ආක්‍රමණකාරී විශේෂ තුරන් කිරීමට උපකාරී වන වැඩසටහන් පිළියෙල කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය දේශපාලන නායකත්වය ලබාදීමට මම සහතික වෙමි.

ජෛව විවිධත්ව සංරක්ෂණයේදී, ආක්‍රමණකාරී විශේෂ ඇතුළුවීම වැලැක්වීම, එය ඉවත්කිරීමට හෝ විනාශකිරීමට වඩා පහසුය. වියදම් අඩුය. ජෛව විවිධත්ව සම්මුතියේ පරිච්ජේද 8 (h) වලට අනුකූලව ජීවීන්ට වාසස්ථාන වලට හෝ පරිසර පද්ධතිවලට, තර්ජනය එල්ල කරන ආගන්තුක, ආක්‍රමණකාරී විශේෂ වැළැක්වීමට, පාලනය කිරීමට හෝ විනාශ කිරීමට එම සම්මුතියේ පාර්ශවකරුවකු වශයෙන් ශ්‍රී ලංකාවද බැදී සිටී.

මෙම ජාතික වැඩමුළුවේදී මෙම ආගන්තුක, ආක්‍රමණකාරී විශේෂ පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමත්, ඒ පිළිබඳව සාකච්ජා කිරීමත් තුළින් ක්‍රියාත්මක සැළසුමක් සකස් කිරීමට මෙහි පැමිණි සිටින විද්වතුන් කටයුතු කරනු ඇතැයි මම විශ්වාස කරමි.

අවසාන වශයෙන්, ඒ සඳහා මගේ අමාත්‍යාංශය මගින් ලබාදිය හැකි සෑම ආකාරයකම සහයෝගය ලබාදීමටත්, ඒ සඳහා අවශ්‍ය දේශපාලන නායකත්වය ලබා දීමටත් සුදානම් බව නැවතත් අවධාරණය කරමි. ආක්‍රමණකාරී විශේෂ පිළිබඳ මෙම ජාතික වැඩමුළුව සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි. ඔබ සැමට ස්තුතියි.

